**රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය -2017**

-----------------------------------------------------------------------

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2010 ජුනි 07 දින එළඹි අංක 2624 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි වගකීම දරයි. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධතියෙහි ණය ගැනුම්කරුගේ මූල්‍ය අවකාශය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,344.8 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 40.8 ක් වන අතර ඉන් රු.මිලියන 4,034.8 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 30.8 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය කාර්යයන් 2010 මැයි 01 දින ආරම්භ කරන ලද අතර 2013 ඔක්තෝබර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2018 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක  කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා

සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණ බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ල.ම.බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආ.සං.බැ. | 30.80 | 4,034.80 | 1,979.00 | 1,431.00 | 20.78 | 2,947.00 |
| ශ්‍රීලංර | 10.00 | 1,310.00 | 216.00 | 213.00 | 3.47 | 488.00 |
| එකතුව | **40.80** | **5,344.80** | **2,195.00** | **1,644.00** | **24.25** | **3,435.00** |

ඉහත තොරතුරු අනුව, රු. මිලියන 4034.80 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 30.80 ක් වූ මුළු වෙන් කිරීමෙන් ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කර වර්ෂ 7 ½ ක් ගත වීමෙන් පසුවත්, ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණේ රු. මිලියන 2,947.00 කට සමාන එ.ජ.ඩොලර් 20.78 ක් හෙවත් සියයට 67 ක් පමණකි. එබැවින් වෙන් කිරීම් වලින් එ.ජ.ඩොලර් මිලියන 10.02 ක්වූ ඉතිරි ශේෂය හෙවත් සියයට 33 ක මුදල ඉදිරි මාස 10 ක කාලපරිච්ඡේදය තුල උපයෝජනය කිරීමේ හැකියාව බොහෝ දුරට සැක සහිතය.

## 3.2 භෞතික ප්‍රගතිය

ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම හා ධාරිතා සංවර්ධනය නම් වූ ප්‍රධාන සංරචක දෙකකින් ව්‍යාපෘතියේ කාර්යයන් සමන්විත වේ. 2017 දෙසැම්බර් 31 දිනට එම සංරචකයන් යටතේ ඇති කාර්යයන්ගේ භෞතික ප්‍රගතිය පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තොරතුරු පද්ධති යටිතල පහසුකම් සැපයීම, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ගනුදෙනුකාර භාවිතය හා ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු. මිලියන 2356.75 කට සමාන එ.ජ.ඩො. මිලියන 17.76 කට 2013 ඔක්තෝබර් 14 දින විදේශීය සමාගමකට පිරිනමා තිබුණු අතර 2016 ජනවාරි 13 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුල ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කර තිබුණද, අළුතින් ස්ථාපනය කරන ලද තොරතුරු පද්ධතිය ගණුදෙනුකාර භාවිතය සඳහා ඉටුකරන කාර්යයන්ගේ භෞතික ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසානයට මන්දගාමීව පැවතුණි. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ දන්වා සිටිනු ලැබුයේ අතරමැදි නියෝජිතායතන සමඟ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය දත්ත හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් එකඟතාවයක් නොමැතිවීම හා ඒ සම්බන්ධයෙන් වූ දුර්වල ප්‍රතිචාර පද්ධතිය ගණුදෙනුකාර භාවිතය කිරීම දිගුකාලීනව පමාවීමට බලපා ඇති බව සහ 2018 සැප්තැම්බර් මාසය තුල මෙම පරතරය අවම කිරීමටත්, පද්ධතියේ හඳුනාගත් දෝෂ නිවැරදි කිරීමටත් කටයුතු කරන බවයි.

(ආ) ධාරිතා සංවර්ධන සංරචකය යටතේ පුහුණු කිරීමට නියමිත නිලධාරීන්ගේ වාර්ෂික ඉලක්ක ව්‍යාපෘතියේ ආරම්භක අවස්ථාවේදී තීරණය කර නොතිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ධාරිතා සංවර්ධන සංරචකය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන අනෙකුත් දෙපාර්තමේන්තුවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 140 දෙනෙකුට විදේශ පුහුණුව හා මණ්ඩලික සාමාජිකයන් 100 කට දේශීය පුහුණුව පමණක් සමාලෝචිත වර්ෂය තුල ලබාදීමට කටයුතු කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ලැබී තිබුණු තොරතුරු අනුව, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම හා ධාරිතා සංවර්ධනය සඳහා අදාල කටයුතු සම්පූර්ණ කිරීම පමාවීම සම්බන්ධයෙන් සංවර්ධන හා අන්තර් ක්‍රියාකාරකම්වල අභ්‍යන්තර පරීක්ෂණ පමාවීම, අඩුපාඩු යෝජනා සඳහා වන සහ පද්ධති විසින් දත්ත සංක්‍රමණ කටයුතු අවසන් කිරීමේ කටයුතු හා රේඛීය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය අඛණ්ඩ කැපවීම නොමැතිවීම ආදී කරුණු බලපා තිබුණි.